*පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය*

# ජංගම ආපනශාලාවක් පවත්වාගෙන යාම සඳහා අයදුම්පත් කැඳවීමයි.

මෙම අමාත්‍යාංශයේ සේවයේ නියතු සියලු මට්ටම් වල සේවක මහත්ම මහත්මීන්ගේ සුභසාධන කටයුතු දිරිගැන්වීම මූලික කරගෙන සතියේ දිනවල රාජකාරී වේලාවන්හි දි මෙම අමාත්‍යාංශ පරිශ්‍රය තුල ජංගම ආපනශාලාවක් පවත්වාගෙන යාම සඳහා එකී සේවා සපයනු ලබන සැපයුම්කරුවන්ගෙන් අභිලාෂ කැඳවනු ලැබේ.

- පහත සඳහන් තොරතුරු, තම අභිලාෂය සැකසීමේදී ඇතුලත් විය යුතුය.

  - **ව්‍යාපාර නාමය**
  - **ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය**
  - **ලිපිනය**
  - **අයදුම්කරුගේ නම**
  - **අයදුම්කරුගේ ලිපිනය**
  - **අයදුම්කරුගේ දුරකතන අංකය හා ෆැක්ස් අංකය**
  - **සැපයීමට හැකි ආහාර වර්ග හා ඒවායේ මිල ගණන්**
  - **සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුව ආහාර ඇසුරුම් කිරිම**
  - **සේවා සපයන ජංගම රථය පිළිබඳ තොරතුරු**
  - **කසල බැහැර කරන ක්‍රමවේදය සහ ජලය,විදුලිය සපයා ගන්නා ආකාරය**
  - **අභිලාෂ පිළිබඳ තොරතුරු**

ඉහත තොරතුරු ඇතුලත් අයදුම්පත්‍රය ලිපි කවරයක බහා කවරයේ වම් කෙලවර **“ ජංගම ආපනශාලාව සඳහා අභිලාෂ කැඳවීම - 2021 ”**යන්න සඳහන් කර පහත සඳහන් ලිපිනයට **2021.04.30** දිනට ප්‍රථම ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කල යුතුය.

**ලේකම්,**
**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,**
**330,යුනියන් පෙදෙස,**
**කොළඹ 02.**

- නියමයන්/කොන්දේසි මෙම අමාත්‍යාංශයේ **www.pclg.gov.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

## නියමයන් හා කොන්දේසි

- ජංගම ආපනශාලාව සහිත වාහනය නවතා තැබීමේ බිම් පහසුකම් පමණක් මෙම අමාත්‍යාංශය විසින් සපයනු ලැබේ.
- අමාත්‍යාංශ නිලධාරින් සඳහා සහනදායී මිල ගණන් යටතේ ආහාර පාන ලබා දිය යුතුය.
- පිරිසිදු හා ගුණාත්මක භාවයෙන් යුතු පිසූ ආහාර පාන පමණක් සැපයීමට කටයුතු කල යුතු අතර අහාර පාන මිලදී ගැනීමේ පහසුකම් පමණක් ලබා දිය යුතුය.
- යම් දිනක ආපනශාලාව විවෘත නොකරන්නේ නම් විවෘත නොකරන දිනට දින දෙකකට පෙර දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමෙන් ඒ බව දැන්විය යුතුය.
- අහාර පානවල මිල දර්ශනයක් ප්‍රදර්ශනය කල යුතුය.
- සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවා ඇති COVID 19 පැතිරීම වැලැක්වීමේ මාර්ගෝපදේශන වලට අනුකූලව සෑම විටම කටයුතු කල යුතුය.
- අපද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් ඔබ විසින් සකසා ගත යුතුය.